# 2. මැවිල්ල සුරකින අපි

**දෙවියන් වහන්සේ මැවූ සුරක්ෂිත ලෝකය, ආරක්ෂා කිරීමේ වගකීම දෙවියන් වහන්සේ විසින් පවරා ඇත්තේ අපට ය. ඒ සම්බන්ධ ව ඉගෙන ගැනීම මෙම පාඩමින් අපේක්ෂිත ය.**

## උත්පත්ති 1:28-30, 2:15

**දෙවියන් වහන්සේ ඔවුන්ට ආසිරි පතමින්**
**"නුඹලා දරු සම්පත් ලබා වැඩි වර්ධනය වී**
**පොළොව පුරා පැතිර එය යටත් කරගන්න.**
**මුහුදේ මසුන් කෙරෙහි ද, අහසේ පක්ෂීන් කෙරෙහි ද,**
**පොළොවේ සැරිසරන සියලු සතුන් කෙරෙහි ද**
**බලය පවත්වන්නැ"යි ඔවුනට වදාළ සේක.**
**(උත්පත්ති 1:28)**

දෙවි පියාණන් වහන්සේ මිනිසා මනහර ඒදන් උයනේ පදිංචි කර වූ අතර එම උයන තුළ මිනිසාට සතුටින් ජීවත් වීමට අවශ්‍ය වටපිටාව නිර්මාණය වී තිබුණි. එම සියලු ම මැවිල්ල මිනිසා වෙත දෙවියන් වහන්සේ බාර දුන් සේක. මිනිසා වෙත දෙවියන් වහන්සේ ආශිර්වාද කරන්නේ මැවිල්ල රැක ගැනීමේ වගකීම ද පවරමිනි.

**දෙවි පියාණන් වහන්සේ මිනිසාට ලබා දුන් වගකීම්**

- දරු සම්පත් ලැබීම.
- පොළොව පුරා පැතිර එය පාලනය කිරීම.
- සතුන් ආරක්ෂා කිරීම හා පාලනය.
- භූමිය රැකගෙන එය වගා කිරීම.
- මැවිල්ලෙන් නිසි ප්‍රයෝජන ගැනීම.

පහත බයිබල් පාඨය තුළින් එය තවදුරටත් තහවුරු වේ.

**ඒදන් උයන වගා කර එය රැකබලා ගැනීම පිණිස**
**දෙවි සමිඳාණන් වහන්සේ මිනිසා රැගෙන**
**ඔහු එහි පදිංචි කරවූ සේක.**
**උත්පත්ති 2:15**

එදා දෙවි සමිඳාණන් වහන්සේ, ඒදන් උයන රැක බලාගන්නා පිණිස මිනිසා එහි පදිංචි කරවූ සේක. ඒදන් උයන රැකබලා ගැනීම යනු මුළු මැවිල්ල සුරැකීම යි. එසේ ම මැවිල්ල වර්ධනය කිරීමත් එම මැවිල්ල තුළින් නිසි ප්‍රයෝජන ගැනීමත් මිනිසාගේ වගකීම වේ.

මෙනෙහි කරන්න.




වර්තමාන සමාජය තුළ මිනිසාගේ ආත්මාර්ථකාමී ක්‍රියාකාරකම් නිසා දේව මැවිල්ල වෙත අහිතකර බලපෑම් ඇති වී තිබේ. එයින් මිනිසාට ගංවතුර, නායයෑම්, නියඟය, ලෙඩ රෝග, වැනි අයහපත් ප්‍රතිවිපාකවලට මුහුණ දීමට සිදු වී ඇත. නෝවාගේ කාලයේ මිනිස් සමාජය දූෂණය වීමේ ප්‍රතිඵලයක් ලෙස ජල ගැල්මක් ඇති වූ ආකාරය ශුද්ධ බයිබලය අපට පෙන්වා දෙයි.

## මිනිසා විසින් දේව මැවිල්ල විනාශ කරන අවස්ථා මොනවා ද?



ගස් කපා වනාන්තර එළි පෙහෙළි කිරීම



අපවිත්‍ර ජලය පිරිසිදු ගංගාවලට මුදා හැරීම



වායු දූෂණය



පරිසර දූෂණය

දේව මැවිල්ල මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් දූෂණයට ලක්වන අවස්ථා කිහිපයක් ඉහත රූප සටහන්වලින් ඔබට අවබෝධ කරගත හැකි වේ. එම දූෂිත තත්ත්වයෙන් ලෝකය ආරක්ෂා කර ගැනීමට ඔබට පහත ක්‍රියාමාර්ග අනුගමනය කළ හැකි වේ.

- නිවස අවට පරිසරය සුරැකීම.
- පාසල අවට පරිසරය පිරිසිදුව පවත්වාගෙන යෑම.
- පාසල තුළ ක්‍රියාත්මක වන පරිසරය සුරැකීමේ සංවිධානවලට සම්බන්ධ වී ක්‍රියා කිරීම.
- ඔබේ ප්‍රදේශයේ පරිසරය සුරැකීමට පිහිටා ඇති සංවිධානවලට සම්බන්ධ වී ක්‍රියා කිරීම.
- පරිසරය සුරැකීමට ක්‍රියාත්මක වන ශ්‍රමදාන සඳහා දායක වීම.
- පොලිතීන් ප්ලාස්ටික් වැනි දිරාපත් වීමට දිගුකලක් ගතවන දේ භාවිතයෙන් ඇත් වීම.
- සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කිරීම.
- පරිසරයට ආවේණික ගහකොළ, සතුන් ආරක්ෂා කරගැනීම

දෙවි පියාණන් වහන්සේ අපට ලබා දුන් මැවිල්ල ආරක්ෂා කරමින් වැඩි දියුණු කර අනාගත පරපුර වෙත දායාද කිරීම අපගේ වගකීම ය. අප වෙත දෙවියන් වහන්සේ ලබා දී ඇති සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කළ යුතු ය. එසේ ම අපට පමණක් නොව අන් අයගේ ජීවිත ද සුරක්ෂිත කරන පරිසරයක් ලබා දීම අපගේ යුතුකමක් හා වගකීමක් ද වෙයි.

### ක්‍රියාකාරකම

**1.** මැවිල්ල ආරක්ෂා කිරීමට, වර්ධනය කිරීමට හා නිසි ප්‍රයෝජන ගැනීමට ඔබ විසින් ගන්නා ක්‍රියාමාර්ග 2 ක් ලියන්න.

**2.** විදුහලේ පරිසර සංවිධානයේ වාර්ෂික පරිසරය සුරැකීමේ සැලැස්මක් සෑදීමට කමිටු සාමාජිකයකු ලෙස ඔබට පැවරී ඇතැයි සිතන්න. ඒ සඳහා ඔබ ඉදිරිපත් කරන යෝජනා 5 ක් ලියන්න.